**2022 පෙබරවාරි 02 වැනි දා**

1. මහින්ද යාපා අබේවර්ධන මහතා, කතානායක.
2. මහින්ද රාජපක්ෂ මහතා, අග්‍රාමාත්‍ය.
3. සජිත් ප්‍රේමදාස මහතා, විපක්ෂ නායක.
4. පාර්ලිමේන්තුවේ සියලුම පක්ෂ නායකවරුන්.
5. සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ.

6. සභාපති සහ කොමසාරිස්වරුන්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,
ආර් ඒ ද මැල් මාවත, කොළඹ.

7. ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා, සභාපති, ශ්‍රී ලංකා නීතිඥ සංගමය,
මිහිඳු මාවත, කොළඹ 12.

8. ජනාධිපති නීතිඥ අලි සබ්රි මහතා, අධිකරණ අමාත්‍ය,
අධිකරණ අමාත්‍යාංශය, අධිකරණ මාවත, කොළඹ 12.

9. සභාපති සහ කොමසාරිස්වරුන්, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම සඳහා වන කොමිෂන් සභාව,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය, කොළඹ.

10. සංජය රාජරත්නම් මහතා, නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව, නොම්බර 159, අලුත්කඩේ, කොළඹ 12.

කතානායකතුමනි,අගමැතිතුමනි,විපක්ෂ නායකතුමනි, පක්ෂනායකවරුනි, මන්ත්‍රීවරුනි,

**<u>යෝජිත පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ ඇතැම් විධිවිධාන මගින් මූලික අයිතිවාසිකම් කඩවීම ගැන දැනුම්දීම සහ අවශ්‍ය සංශෝධන ඉල්ලා සිටීම</u>**

- බොහෝ රටවල් අන පනත් ගෙන එන්නේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අභිලාෂයෙන් වුවද, පනතක් සම්මත කිරීමෙන් පසු ඒවා භාවිතය ගැනෙද්දී සහ ඒවායේ විධි විධාන ක්‍රියාවට නංවද්දී බොහෝ විට සිදුවන්නේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් කඩ වන අයුරින් බව අප සියලු දෙනාම දන්නා කරුණකි. ශ්‍රී ලංකාවේ සෑම ආණ්ඩුවක්ම පාහේ විරුද්ධ පක්ෂ සහ විරුද්ධ මතධාරීන් මර්දනය කිරීම සඳහා අන පනත් යොදා ගන්නා බවට පසුගිය 10 වසරක කාලය දෙස පමණක් බැලූවිට අවශ්‍ය තරම් උදාහරණ දැක්විය හැකිය. ජනතාවගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා අත්සන් තබා ඇති අයි.සී.සී.පී.ආර් ප්‍රඥප්තිය ප්‍රකාරව සම්මත කර ඇති 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි.සී.සී.පී.ආර්) පනත ප්‍රායෝගික භාවිතයේදී පුරවැසියන්ගේ අයිතිවාසිකම් මර්දනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ යොදා ගැනීමම ඊට කදිම උදාහරණයකි. එසේ හෙයින් නීතියක් සම්මත කරද්දී වඩාත් සුපරීක්ෂාකාරීව සම්මත කළ යුතු බව අපගේ අදහසයි.

- ලෝකයේ බොහෝ රටවල පෞද්ගලික දත්ත ආරක්ෂණ නීති සම්මත කරනු ලබන්නේ පෙර සඳහන් කළ ආකාරයටම පුරවැසියන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමේ අභිලාෂයෙනි. ව්‍යාපාරික හෝ වෙනත් කූඨ ජාවාරම්වලට පුරවැසියන්ගේ පෞද්ගලික දත්ත භාවිත කිරීම නතර කිරීම අපේක්ෂා කළ ද අනිත් පනත් මෙන්ම එය ද සම්මත කිරීමෙන් පසු භාවිතය සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් පවතී. විශේෂයෙන්ම බොහෝ රටවල්වල දත්ත ආරක්ෂණ නීතිවලින් ජනමාධ්‍ය සම්බන්ධයෙන් යම් නිදහසක් ලබාදී තිබේ. ඉන්දියාවේ කෙටුම්පතේ ද එවැනි නිදහස් කිරීමක් තිබේ. කෙසේ වෙතත් ඊටත් වඩා සහනයක් ඉල්ලමින් ඉන්දියාවේ ජනමාධ්‍යවේදීහු සටන් කරති.

- අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ ඇති පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පතේ ද අභිලාෂය පුරවැසියන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම විය හැකි වුවද, බැලූ බැල්මට එහි බරපතල ගැටලුකාරී තැන් කිහිපයක් ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ලෙස අපි නිරීක්ෂණය කළෙමු. ඒ අනුව ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ කාරක සභාවේ උපදෙස් පරිදි එහි ක්‍රියාකාරී සිමාජිකයන් දෙදෙනකු ලෙස මෙම ලිපියට අත්සන් තබන අපි දෙදෙනා 2022 ජනවාරි මස 27 වැනිදා ඔන්ලයින් මගිනුත්, ජනවාරි මස 28 වැනිදා සාමාන්‍ය ක්‍රමයටත් විශේෂ පෙත්සම් දෙකක් ගොනු කරනු ලැබීමු. එහි අංකය S.C.(S.D) 10/2022 වේ.

- විමර්ශන කිරීම, විභාග කිරීම මෙන්ම දඬුවම් පැමිණවීම ද එකම ආයතනයකට පවරමින් නීතියේ පිළිගත් මූලධර්ම උල්ලංඝණය කරමින් ඉදිරිපත් කර ඇති මෙම පනතට එරෙහිව ජනවාරි මස 27 වැනිදා ඔන්ලයින් මගින් පෙත්සම ගොනු කළ ද, කාලාවරෝදය පිළිබඳ විරෝධයක් නීතිපතිවරයා මතුකිරීම නිසා පෙත්සම නිෂ්ප්‍රභ කෙරෙණි.

- එම විශේෂ පෙත්සම නිශ්ප්‍රභ කළ ද එම පනත් කෙටුම්පතේ අයිතිවාසිකම් කඩවන තැන් සංශෝධනය කළ යුතු බව ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ලෙස අපගේ අදහසයි. මෙම පනත මගින් ජනමාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් හීන වීමක් මෙන්ම 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ බලය හීන වීමක් සිදුවේ. එමෙන්ම ස්වාධීන නොවන සහ අධිකරණයක් නොවන ආයතනයකට ( දත්ත ආරක්ෂණ අධිකාරිය ) පැමිණිලි විභාග කිරීමට මෙන්ම දඬුවම් කිරීමේ බලයද ලැබෙන බැවින් එය බරපතල තත්ත්වයක් සේ අපි සලකමු. එසේ හෙයින් මෙම පනත සම්මත කිරීමට පෙර අවශ්‍ය සංශෝධන සිදු කළ යුතුය. එසේ නොකළහොත් පනත ගෙන ඒමේ යහපත් අභිලාෂයද ප්‍රශ්නකාරී වනු ඇත. එසේ හෙයින් මෙම පනත සම්බන්ධයෙන් අවශ්‍ය බවට අප අදහස් කරන සංශෝධන සවිස්තරාත්මකව පහත විස්තර කර ඇත.

- පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහාත්, මෙම පනතේ ජනතාවාදී බව සහ යහපත් අභිලාශය පෙන්නුම් කිරීම සඳහා මෙම පනතට පහත සංශෝධන සිදු කිරීම සඳහා මැදිහත් වන ලෙස ඔබ සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිමු.

**යෝජනා කරන සංශෝධන**

- අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇති පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ 47 වැනි වගන්තියේ අර්ථ නිරූපන දක්වා තිබේ. එහි ‘පෞද්ගලික දත්ත’ යන්නට ලබා දී ඇති අර්ථ නිරූපනය මෙසේය.

‘(අ) යම් නාමයක්, හඳුනා ගැනීමේ අංකයක්, ස්ථානීය දත්තයක් හෝ යම් මාර්ගගත හඳුන්වනයක් වැඩි යම් හඳුන්වනයක් හෝ,

(ආ) එම පුද්ගලයාගේ හෝ ස්වාභාවික තැනැත්තාගේ කායික විද්‍යාත්මක, කායික ජානමය, මානසික, ආර්ථික, සංස්කෘතික හෝ සමාජයීය අනන්‍යතාවයට විශේෂිත වූ සාධක එකක් හෝ වැඩි ප්‍රමාණයක්,

ආශ්‍රයෙන්, සෘජුව හෝ අන්‍යාකාරයෙන් යම් දත්ත දායකයකු හඳුනා ගත හැකි යම් තොරතුරක් අදහස් වේ. ‘

- එනම් පුද්ගලයෙක් ඍජුව හෝ වක්‍රව හඳුනාගත හැකි සියලුම තොරතුරු පෞද්ගලික දත්ත යටතට වැටෙයි. ජනමාධ්‍යයේදී දෛනිකව භාවිත කරන බොහෝ දත්ත මෙම පනතේ 'පෞද්ගලික දත්ත' යන නිර්වචනයට අදාල වෙයි.

- 'දත්ත සැකසීම' යන්නට ඉහත සඳහන් කළ දත්තවලට අදාලව පහත පරිදි අර්ථ නිරූපන ලබා දී තිබේ.

'පෞද්ගලික දත්ත එකතු කිරීම, ගබඩා කිරීම, සුරක්ෂිත කිරීම, වෙනස් කිරීම, නැවත ලබා ගැනීම, හෙළි කිරීම, සම්ප්‍රේෂණය කිරීම, ලබා ගැනීමට සැලැස්වීම, මැකීම, විනාශ කිරීම, විමසීම, පෙළ ගැස්වීම, සංයුක්ත කිරීම හෝ ඒවා පිළිබඳව තාර්කික හෝ අංක ගණිතමය මෙහෙයුම් සිදු කිරීම ඇතුළත් වන නමුත් ඒවාටයටම පමණක් සීමා නොවන පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් කරනු ලබන යම් මෙහෙයුමක් අදහස් වේ.'

- සරලව සඳහන් කරන්නේ නම් පුද්ගලයකුගේ නමක් ගත්විට එම නම ඇසීම, නම් එකු කිරීම, නමක් පළ කිරීම ඇතුළු සියල්ලක්ම 'දත්ත සැකසීම' යන්න අදාල වෙයි. ජනමාධ්‍යවේදීන් නිතරම කරන සෑම ක්‍රියාවක්ම පාහේ මෙම 'දත්ත සැකසීම' යන නිර්වචනයට අදාල වේ.

## 01) පනත් කෙටුම්පතේ 2වැනි වගන්තිය සංශෝධනය කිරීම

මෙම පනත අදාල වන්නේ කා හටද යන්න පනතේ 2 වැනි වගන්තියේ සඳහන් කර තිබේ. එම වගන්තිය සරලව ගත් විට ශ්‍රී ලංකාවේ වාසය කරන සියලුම පුද්ගලයන්ට මෙම පනත අදාල වේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ යම් ලිඛිතන නීතියක් යටතේ පිහිටුවනු ලැබූ, ලිඛිත නීතියකට යටත් 'පාලකවරයකු' හෝ 'දත්ත සකසන්නකු' විසින් දත්ත සැකසීම සිදුකරනු ලබන විටදී මෙම පනත අදාල විය යුතු බව දෙවැනි වගන්තියේ පළමු උප වගන්තියේ සඳහන් කර තිබේ.

එම උප වගන්තියේ එන 'පාලකවාරයා' යන්න පනතේ 47 වැනි වගන්තියේ අර්ථ නිරූපනය කර ඇත්තේ මෙසේය.

'තනිව හෝ අන් අය සමඟ ඒකාබද්ධව පෞද්ගලික දත්ත සැකසීමේ අරමුණු සහ ක්‍රම නිශ්චය කරනු ලබන යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, පොදු අධිකාරියක්, රාජ්‍ය නොවන සංවිධානයක්, නියෝජිත ආයතනයක් හෝ වෙනත් යම් මණ්ඩලයක් හෝ අස්ථිත්වයක් අදහස් වේ.'

එනම් පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් (නමක්, ගමක් ඇතුලු පෙර සඳහන් කළ සියල්ල) කටයුතු කරන ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියෙකු මෙන්ම රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් ආයතන 'පාලකවරයා' යන අර්ථකතනය යටතට වැටෙයි. සරලව

කිවහොත් මේ ඕනෑම පුද්ගලයකු හෝ ආයතනයක් මෙම පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අදාලවේ. 'දත්ත සකසන්නා' යන්නට පාලකවරයා වෙනුවට එම ක්‍රියාව කරන වෙනත් කෙනෙකු අදහස් කෙරේ.

ඒ අනුව මෙම පනතේ දෙවැනි වගන්තිය අනුව ජනමාධ්‍යකරණයේ නියැලෙන සියල්ලෝම ද මෙම පනතට අයත් වෙති. ඔවුන් සියලු දෙනා කෙරෙහි මෙම පනත අදාල වේ. මෙම පනත සම්මත වුවහොත් දෛනිකව දත්ත සමඟ වැඩ කරන ජනමාධ්‍යවේදීන්ට ගැටලුකාරී තත්ත්වයන් ඇති විය හැකිය. එමෙන්ම තොරතුරු පනත භාවිතාව සම්බන්ධයෙන්ද ගැටලුකාරී තත්ත්වයක් ඇතිවිය හැකිය. පනතේ දෙවැනි වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් පනත අදාල නොවීම සම්බන්ධයෙන් කරුණු දෙකක් දක්වා ඇත. ඒ යටතේ එනම් මෙම පනතේ තුන් වැනි වගන්තියේ 'ආ' වලට පසුව පහත වගන්ති දෙක ඇතුළත් කර කෙටුම්පත සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිමු.

'(ඇ) ජනමාධ්‍යකරණය ඇතුළු භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිය භුක්ති විඳීමේදී සකස් කරන පෞද්ගලික දත්ත,

(ඈ) 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාවට නැංවීමේදී සකස් කරන පෞද්ගලික දත්ත,'

## 02) පනත් කෙටුම්පතේ 03 වැනි වගන්තිය සංශෝධනය කිරීම

මෙම පනත සහ වෙනත් පනත් අතර අනනුකූලතාවක් ඇතිවුවහොත් බලපැවැත්වෙන නීතිය සම්බන්ධයෙන් පනත් කෙටුම්පතේ තුන් වැනි වගන්තියේ සඳහන් වේ. තුන් වැනි වගන්තියේ 2 වැනි උප වගන්තියේ මෙසේ සඳහන්වේ.

'(2) මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලඛිත නීතියක විධිවිධාන අතර යම් අනනුකූලතාවක් ඇති අවස්ථාවක, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතුය.'

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ශ්‍රී ලංකාවේ පනත සම්බන්ධයෙන් ජාතික වශයෙන්ම මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද විශාල පිළිගැනීමක් ඇතිවී තිබෙන අතර එය ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමේදී යහපත් ඉදිරි පියවරක් ලෙසද සැලකේ. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ තුන් වැනි වගන්තියේ ඉහත ප්‍රතිපාදනය මගින් අනාගතයේ දී තොරතුරු පනත සමඟ යම් ගැටුම්කාරී තත්ත්වයක් ඇතිවිය හැකි අතර, මෙම වගන්තිය උපයෝගී කර ගනිමින් තොරතුරු පනතේ බලතල හීන කිරීමට ඇතැම් පොදු අධිකාරීන් උත්සාහ කරනු ඇත. විශේෂයෙන්ම මෙම පනත යටතේ පිහිටුවන ආයතනය තොරතුරු පනත යටතේ 'පොදු අධිකාරිය' යන නිර්වචනයට වැටෙන අතර තොරතුරු කොමිෂන් සභාවේ නියෝගවලින් 'පොදු අධිකාරීන්' බැඳේ. මෙම පනත තොරතුරු පනත

අභිබවා ක්‍රියාත්මක වුවහොත් තොරතුරු කොමිෂන් සභාව යටතේ නියෝගවලින් බැඳී සිටින පොදු අධිකාරියක් වන මෙම පනත යටතේ පිහිටුවන 'අධිකාරි' මගින් ලබා දෙන නියෝගවලට තොරතුරු කොමිසම යටත් වීමේ බරපතල තත්ත්වයක් අනාගතයේ දී ඇතිවිය හැකිය. එසේ නොවීමට සහ තොරතුරු පනත පෙරමෙන්ම බලපැවැත්වෙන බව සහතික කර පෙන්වීම සඳහා මෙම පනතේ තුන් වැනි වගන්තියේ (2) උප වගන්තියට පසු පහත වගන්තිය එකතු කරමින් කෙටුම්පත සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිමු.

'එසේ වුවද මෙම පනතේ විධිවිධාන සහ 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් මෙම පනත අභිබවා 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බලාත්මක විය යුතුය.'

### 03) පනත් කෙටුම්පතේ 05 වැනි වගන්තිය සංශෝධනය කිරීම

නීත්‍යානුකූල ආකාරයෙන් දත්ත සකස් කිරීම සම්බන්ධයෙන් මෙම පනත් කෙටුම්පතේ පස්වැනි වගන්තියේ සඳහන් කර තිබේ. දත්ත සකස්කිරීම නීත්‍යානුකූල වීමට පළමු උපලේඛනයේ සිට හතර වැනි උපලේඛනය දක්වා කරුණු ඇතුළත් තර තිබුණද, ජනමාධ්‍යකරණය සඳහා සහ/හෝ භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සඳහා සහ/හෝ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම ක්‍රියාවට නැංවීම සඳහා දත්ත සකස් කිරීම නීත්‍යානුකූල බව පස් වැනි වගන්තිය යටතේ හෝ උපලේඛන යටතේ පැහැදිලිව සඳහන් කර නැත. බැලූ බැල්මට පනත කියවන අයකුට ඉහත සඳහන් කාරණාවලට අදාලව 'දත්ත සකස් කිරීම' නීති විරෝධී බවට අදහසක් එමගින් ජනිත වෙයි. එසේ හෙයින් පනතේ පස් වැනි වගන්ති 'ඇ' උප වගන්තියට යටින් පහත වගන්ති දෙක ඇතුළත් කර කෙටුම්පත සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිමු. ඊට ගැලපෙන පරිදි පස් වැනි වගන්තියේ අවසාන වචන කිහිපය වන 'අනුකූලව කටයුතු කරන්නේ නම්, පෞද්ගලික දත්ත සැකසීම නීත්‍යානුකූල වන්නේ ය' යන්න සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිමු.

'(ඉ) ජනමාධ්‍යකරණය ඇතුළු භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිය ක්‍රියාවට නැංවීම සඳහා ද, හෝ

(ඊ) තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාවට නැංවීම සඳහා ද,'

### 04) පනත් කෙටුම්පතේ 17 වැනි වගන්තිය සංශෝධනය කිරීම

මෙම පනතේ 13, 14, 15 සහ 16 යන වලන්තිවල විධිවිධාන ජනමාධ්‍යවේදියකු දත්ත පාලකයකු හෝ සකසන්නකු වන අවස්ථාවකදී ක්‍රියාවට නැංවීමෙන් ජනමාධ්‍යවේදියාගේ

වෘත්තීය කටයුතු සිදුකරගෙන යෑමට බරපතල ගැටලුකාරී තත්ත්වයක් මතුවිය හැකිය. එසේ එහෙයින් ජනමාධ්‍යවේදියකු පාලකයකු හෝ දත්ත සකන්නකු වන විට විට මෙම විදිවිධාන අදාල නොවන බවට වූ වගන්තියක් 17 වගන්තියේ හත් වැනි උප වගන්තියට පසු එකතු කරමින් කෙටුම්පත සංශෝධනය කරන මෙන් ඉල්ලා සිටිමු.

'(8) 13 වන, 14 වන, 15 වන සහ 16 වන වගන්තිවල කුමක් සඳහන් වුවද, ජනමාධ්‍යවේදියකු සම්බන්ධයෙන් හෝ ජනමාධ්‍ය කටයුත්තක් සම්බන්ධයෙන් හෝ තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් හෝ වන විට 13 වන, 14 වන, 15 වන සහ 16 වන වගන්තිවල විධිවිධාන අදාල නොවිය යුතුය. '

## 05) පනත් කෙටුම්පතේ 19 වැනි වගන්තිය සංශෝධනය කිරීම

මීට පෙර සඳහන් කළ සහ මින් මතු සඳහන් කරන සංශෝධන මෙම පනත් කෙටුම්පතේ සිදු නොකළහොත් පනතේ 19 වැනි වගන්තිය මගින් ජනමාධ්‍යවේදියකු සහ/හෝ ජනමාධ්‍ය ආයතනයක් සහ/හෝ ජනමාධ්‍යකරණයට සහාය වන වෙනත් පුද්ගලයකු සහ/හෝ ආයතනයක් සහ/හෝ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාවට නංවන ආයතනයක් මෙම පනත යටතේ ඇති අධිකාරියට කැඳවා ප්‍රශ්න කිරීමට සහ යම් යම් නියෝගවලට ලක්වීමට බොහෝ සෙයින් ඉඩ ඇති බැවින් ජනමාධ්‍යකරණයට සහ තොරතුරු අයිතියට දැඩි ලෙස බාධා ඇති විය හැකිය. එසේ හෙයින් මෙම පනතේ විධිවිධාන ජනමාධ්‍යකරණ සඳහා සහ තොරතුරු අයිතිය සඳහා අදාල නොවන බව සහතික කිරීම සඳහා පනතේ 19 වැනි වගන්තියේ 5 උප වගන්තියට පසුව පහත වගන්තිය ඇතුළත් කරමින් සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිමු.

'(6) මෙම වගන්තියේ විධිවිධාන ජනමාධ්‍යවේදියකු සහ/හෝ ජනමාධ්‍ය ආයතනයක් සහ/හෝ ජනමාධ්‍යවේදිය සම්බන්ධයෙන් සහාය දක්වන්නකුට මෙන්ම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාවට නංවන්නකුට අදාල නොවිය යුතු අතර, ජනමාධ්‍යවේදියකු සහ/හෝ ජනමාධ්‍ය ආයතනයක් සහ/හෝ ජනමාධවේදය සඳහා සහාය දක්වන්නකු මෙන්ම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාවට නංවන්නකු කිසිම හේතුවක් මත මෙම පනතේ සඳහන් අධිකාරියට කැඳවීමට හෝ එම අධිකාරිය මගින් ප්‍රශ්න කරනු ලැබීමට හෝ ලක් නොකළ යුතුය.'

## 06) පනත් කෙටුම්පතේ 28 වැනි වගන්තිය සංශෝධනය කිරීම

මෙම පනත් කෙටුම්පතේ පස් වැනි කොටසින් දත්ත ආරක්ෂණ අධිකාරිය ගැන සහ ඒහි බලතල ගැන සඳහන් වේ. පනතේ 28 වැනි වලන්තිය අනුව දත්ත ආරක්ෂණ අධිකාරිය නම් ආයතනයක් අලුතින් ස්ථාපිත නොවන අතර අමාත්‍යවරයා විසින් කාරණා කිහිපයක් පමණක් සැලකිල්ලට ගනිමින් ඕනෑම රාජ්‍ය ආයතනයක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ

ලිඛිත නීතියක් මගින් පිහිටවූ ආයතනයක් 'දත්ත ආරක්ෂණ අධිකාරිය' ලෙස නම් කළ හැකිය. එනම් රජයේ දැනට පවතින ආයතනයකට මෙම පනතේ වගකීම්ද පැවරෙන අතර එය ස්වාධීන ආයතනයක් වන්නේ නැත.

මෙම පනත ප්‍රකාරව විමර්ශන බලතල පවා ඇති හෙයින් මෙම පනතේ විධි විධාන ක්‍රියාවට නැංවීම සඳහා ස්වාධීන ආයතනයක් පත් කරන ලෙසත්, ව්‍යවස්ථා සභාව මගින් නාමයෝජනා කැඳවීමෙන් පසු සුදුසුකම් බලා එහි ප්‍රධානීන් පත් කරන ලෙසත් ඉල්ලා සිටිමු.

ඊට අදාල වන පරිදි පනතේ 28 වැනි වගන්තිය සංශෝධනය කරන ලෙස ද ඉල්ලා සිටිමු.

## 07) පනතේ 30 වැනි වගන්තිය සංශෝධනය කිරීම

මෙම පනතේ සඳහන් අධිකාරියට ඇති බලතල ගැන පනතේ 30 වැනි වගන්තියේ සඳහන් කර තිබේ. ඒ අනුව එම අධිකාරියට විශාල බලයක් හිමිවන අතර පනත සංශෝධනය නොවුනහොත් ජනමාධ්‍යවේදියකු දත්ත සැකසීම ගැන පැමිණිල්ලක් ලදහොත් පරීක්ෂා කිරීම සඳහා ද බලය තිබේ. එය ජනමාධ්‍යවේදියකුගේ ක්‍රියාකාරිත්වයට දැඩි බලපෑමක් ඇති කරන්නක් බැවින් මෙම පනතේ 30 වගන්තියට පසු පහත වගන්තිය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිමු.

'30 (1) මෙම පනතේ 30 වගන්තියේ 'අ' සිට 'ඩ' දක්වා වූ විධි විධාන ජනමාධ්‍යවේදය සඳහා දත්ත සකස්කිරීමේ දී සහ/හෝ තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාවට නැංවීම සඳහා දත්ත සකස්කරන්නකු විෂයෙහි හෝ බලාත්මක නොවිය යුතුය.'

## 08) පනතේ 33 වැනි වලන්තිය සංශෝධනය කිරීම

මෙම පනත් කෙටුම්පතේ 33 වගන්තියේ පනත අනුව දඬුවම් නියම කරීම ගැන සඳහන් තිබේ. එමගින් විමර්ශනය කිරීම, විභාග කිරීම මෙන්ම දඬුවම් පැමිණවීමේ බලය ද 'දත්ත ආරක්ෂණ අධිකාරියට' ලබා දී තිබේ. එම ආයතනය අධිකරණයක් නොවන අතර විමර්ශන බලතල මෙන්ම දඬුවම් පැමිණවීමේ බලතලද එම ආයතනයට ම ලබාදීම බරපතල ගැටලුකාරී තත්ත්වයක් ඇති කිරීමට හේතුවිය හැකිය. එය නීතියේ පිළිගත් මූලධර්මද අමු අමුවේ උල්ලංඝණය කිරීමකි. එමගින් යුක්තිය පිළිබඳ පුරවැසියාගේ විශ්වාසය පළුදුවීමට ද ඉඩ තිබේ. පෙර සඳහන් කළ පරිදි පනතේ 33 වැනි වගන්තියේ (1) උප වගන්තිය අනුව අධිකරණයක් නොවන මෙම ආයතනයට දඩ නියම කිරීමට බලතල ලබා දී තිබේ. එම දඩ මුදල එක් අනනුකූලතාවක් සඳහා රුපියල් කෝටියක් එනම් මිලියන 10ක් දක්වා වූ පරාසයක පවතී. ශ්‍රී ලංකාවේ මහේස්ත්‍රාත් අධිකරණයකට පවා මෙතරම් විශාල දඩමුදලක් නියම

කිරීමට හැකියාව නොතිබිය දී, අධිකරණයක් නොවන ආයතනයකට මෙතරම් විශාල දඩ මුදලක් නියම කිරීමේ අවස්ථාව ලබාදීම බරපතල තත්ත්වයකි.

ඊට අමතරව මෙම ආයතනය විසින් නියම කළ දඩයකට එරෙහිව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් ඊට පෙර අධිකාරිය නියම කළ දඩ මුදලට සමාන මුදලක් ඇප තැන්පතුවක් වශයෙන් අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ මුදලින් තැම්පත් කළ යුතු බව 33 (8) වගන්තියේ සඳහන් වේ. මෙය ද සුළුවෙන් තැකිය නොහැකි බරපතල තත්ත්වයකි. නියම කරන දඩ මුදලට සමාන මුදලක් සොයා ගත නොහැකි වේ නම් ඔවුන්ට දත්ත ආරක්ෂණ අධිකාරියේ වැරදි තීන්දුවක් ලබා දෙනු ලැබුවද, එම පුද්ගලයාට අදාල තීන්දුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ද මෙම වගන්තිය මගින් අහිමි කර තිබේ.

එසේ හෙයින් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන මෙම වගන්තිය සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිමු.

1) මෙම අධිකාරියට පැමිණිලි විමර්ශනය කිරීමේ හැකියාව තිබුණ ද, විභාග කිරීමේ සහ දඩුවම් නියම කිරීමේ හැකියාව නොතිබිය යුතුය.
2) දඩුවම් නියම කරන්නේ නම් අධිකාරිය විසින් දිසා අධිකරණය හෝ මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩුවක් ගොනු කර නඩු විභාගයෙක් පසු අධිකරණය විසින් තීන්දුව සහ දඩය ප්‍රකාශයට පත් කිරීමට හැකිවන පරිදි සංශෝධන ගෙන ආ යුතුය.
3) අධිකරණය විසින් නියම කරන දඩ මුදල සාධාරණ මුදලක් විය යුතුය.
4) අධිකරණය විසින් නියම කරන දඩයට එරෙහිව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව තිබිය තිබිය යුතු අතර, අභියාචනයක් ඉදිරිපත් කරද්දී ඇප මුදලක් තැම්පත් කිරීම සිදුකළ යුතු බවට වූ විධිවිධාන ඉවත් කර අභියාචනයක් ඉදරිපත් කිරීමේ අවස්ථාව ලබා දිය යුතුය.

## 09) පනතේ 35 වගන්තිය සංශෝධනය කිරීම

මෙම පනතේ 35 වැනි වගන්තියේ නිදහස් කිරීම්, සීමා කිරීම් සහ බලහීන කිරීම ගැන සඳහන් කර තිබේ. නිදහස් කිරීම හෝ බලහීන කිරීම හෝ සීමා කිරීම 'අධිකාරිය' විසින් තීරණය කරනු ලබන්නේ නම් තොරතුරු දැන ගැනීමේ අයිතිය සහ භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිය සම්බන්ධයෙන් බලවත් අගතියක් සිදුවිය හැකිය.එසේ හෙයින් පනතේ 35.1 වැනි වගන්තියට පසු පහත වගන්තිය ද ඇතුළත් කරමින් සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිමු.

'35(2) ජනමාධ්‍යකරණය ඇතුළු භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස ක්‍රියාවට නැංවීමේදී දත්ත සැකසීම සම්බන්ධයෙන් සහ/හෝ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත

ක්‍රියාවට නැංවීම සඳහා දත්ත සැකසීම සම්බන්ධයෙන් ද මෙම පනතේ කිසිම සීමා කිරීමක්, බලහීන කිරීමක් හෝ අධිකාරියේ බලතල ක්‍රියාත්මක වීමක් සිදු නොවිය යුත්තේය.’

ඉහත සඳහන් කළ සංශෝධන මෙම පනත් කෙටුම්පතට ඇතුළත් කරන ලෙස/ කිරීමට අවශ්‍ය බලපෑම් කරන ලෙස ඔබ සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිමු.


ස්තූතියි.



**තරිඳු ජයවර්ධන**

එස්.සී (එස්.ඩී) 10/2022 පෙත්සමේ පෙත්සම්කරු

ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ කාරක සභාවේ උපදෙස් පරිදි.



**එම්.එෆ්.එම් ෆසීර්**

එස්.සී (එස්.ඩී) 10/2022 පෙත්සමේ පෙත්සම්කරු

ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ කාරක සභාවේ උපදෙස් පරිදි.


ලිපිනය - 176/3, ඔරුතොට, ගම්පහ.

ඊමේල් - web.yjasl@gmail.com / tharindu.rti@gmail.com

දුරකතන - 0710 66 14 17 / 0777 66 14 17


<u>**පිටපත්**</u>

01 සිවිල් සංවිධාන

02 සිවිල් ක්‍රියාකාරීන්

03 ජනමාධ්‍ය ආයතන